





# 'ජේ.බී. : ශ්‍රී ලාංකේය සංස්කෘතික විද්වතාණෝ' ග්‍රන්ථය ජනගත වූ දා








ජාතික, සංස්කෘතික, ශාසනික, සාහිත්‍යික හා ආධ්‍යාපනික වශයෙන් මෙරටට සුවිශිෂ්ට යුගකාරක මෙහෙවරක් ඉටු කළ ප්‍රමුඛ විද්වතාණන් වූ, සම්මානිත මහාචාර්ය ජේ.බී. දිසානායක සූරීන්ගේ අපදානය අන්තර්ගත ආචාර්ය නුවන් නයනජිත් විසින් විරචිත 'ජේ.බී. : ශ්‍රී ලාංකේය සංස්කෘතික විද්වතාණෝ' ග්‍රන්ථය ධනංජය කත්‍රිආරච්චිගේ "Printec" සමාගමේ කුලුඳුල් ග්‍රන්ථ ප්‍රකාශනය ලෙස ආදි ආනන්දීය මාධ්‍ය සංසදයේ සංවිධානයෙන් පසුගිය දා කොළඹ මහවැලි කේන්ද්‍රීය ශ්‍රවණාගාරයේදී ජනගත කෙරිණ.

පූජ්‍ය, මහාචාර්ය පාතේගම ඥානිස්සර හිමි මෙහිදී මුලසුන හෙබ වූ අතර, ජ්‍යේෂ්ඨ මහාචාර්ය ප්‍රණීත් අභයසුන්දර, ආනන්ද විද්‍යාලයේ විදුහල්පති ලාල් දිසානායක, විශේෂඥ වෛද්‍ය හැරිස් පතිරගේ, ප්‍රවීණ රූපණවේදී අමිත්ත වීරසිංහ ඇ මහත්වරු මෙහිදී දෙසුම් පැවැත්වූහ.

පූරක දායකත්වය ප්‍රවීණ මාධ්‍යවේදී රොෂාන් වටවල මහතාගෙනි.

ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස මහාචාර්ය සුනන්ද මහේන්ද්‍රයන් ඇතුළු විද්වත්හු රැසක් සහභාගි වූහ.

එහි පළමු පිටපත ආචාර්ය ජේ.බී දිසානායකයන්ට සහ මහාචාර්ය සුනන්ද මහේන්ද්‍රයන්ටද පිරිනැමූ අතර මහාචාර්ය ජේ.බී.දිසානායකයන්ගේ දියණිය ආචාර්යාණි මධුභාෂිණී දිසානායක රත්නායකටද මෙහිදී ග්‍රන්ථය පිරිනැමිණ.























# ලෝක මාධ්‍ය ඡායාරූප ප්‍රදර්ශනය

ලෝක මාධ්‍ය ඡායාරූප ප්‍රදර්ශනය (WORLD PRESS PHOTO EXHIBITION) කොළඹ වන් ගෝල්ෆේස් සංකීර්ණයේදී පසුගිය දා විවෘත විය. ලොවපුරා විසිරී සිටින මාධ්‍ය ඡායාරූප ශිල්පීන් රැසකගේ ඡායාරූප රැගත් මෙම ප්‍රදර්ශනය ශ්‍රී ලංකා පුවත් පත් ආයාතනය, ශ්‍රී ලංකා වේ නෙදර්ලන්ත තානාපති කාර්යාලය සමගින් එක්ව සංවිධානය කර තිබූ අතර, ජනමාධ්‍ය නියෝජ්‍ය ඇමැතිනි ආචාර්ය කෞශල්‍යා ආරියරත්න මෙනවිය අතින් මෙම ප්‍රදර්ශනය විවෘත කළ අතර ශ්‍රී ලංකාවේ නෙදර්ලන්ත තානාපති වෙයිබ් ඩී. බෝර් (WIEBE de BOER) හා ශ්‍රී ලංකා පුවත්පත් අයතනයේ (SLPI) ප්‍රධාන විධායක නිලධාරි කුමාර් ලෝපේටස් යන මහත්වරු ඇතුළු ආරාධිතයෝ රැසක් මෙම අවස්ථාවට සහාගි වූහ.

**ඡායාරූප- ජූඩ් ඩෙන්සිල් පතිරාජ**

























# රමේෂ්ගේ ජන්ම දින සැමරූ දා

සිනමා රසිකයකු වන රමේෂ් රත්නායකගේ විසි තවවැනි ජන්ම දිනය වෙනුවෙන් ජ්‍යෙෂ්ඨතම කලාකරුවන් ඇගැයීමක් පසුගිය දින මහජන පුස්තකාල ශ්‍රවණාගාරයේදී පැවැත්විණි. සිනමා රසිකයකු විසින් ප්‍රථම වතාවට ජ්‍යෙෂ්ඨතම කලාකරුවන් ඇගැයීමක් සිදු කරනු ලැබුවේ මෙයයි. මෙහිදී සරසවිය පුවත්පතේ ප්‍රධාන කර්තෘ ආචාර්ය නුවන් නයනජිත් මහතා ඇතුළු කලාකරුවන් සහ විශේෂ ආරාධිතයෝ ඇගයීම් උලෙළ ආමන්ත්‍රණය කළහ.

























